සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	1	9 - I කොටස ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම්

සැකසුම:- එම්. ටී.කේ.ඩී. ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

1:50,000 භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ

භූ තලය මත ස්වාභාවික ව නිර්මාණය වී ඇති ලක්ෂණ, භෞතික ලක්ෂණ ලෙස හැඳින්වේ.

මෙම භෞතික ලක්ෂණ ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්විය හැකි ය.

- භූ විෂමතා ලක්ෂණ
- ජලවහන ලක්ෂණ
- වෙරළ ලක්ෂණ
- ස්වාභාවික වෘක්ෂලතා

භූ විෂමතා ලක්ෂණ

ස්වාභාවික වෘක්ෂලතා

වෙරළ ලක්ෂණ

ජලවහන ලක්ෂණ

සමෝච්ච රේඛා

- භූ තලය මත ඇති විවිධ භූ රූප ලක්ෂණ 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා මගින් නිරූපණය කෙරේ.

- සමාන උස යා කර නිර්මාණය කරනු ලබන රේඛා සමෝච්ච රේඛා වේ.

- සමෝච්ච රේඛාවේ උස අනුව වටිනාකම් දැක්වේ.

- සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. (20m)

- 100,200,300 වැනි මූලික සමෝච්ච රේඛා තද දුඹුරු වර්ණයෙන්ද, 20,40,60 වැනි අතරමැදි සමෝච්ච රේඛා ලා දුඹුරු වර්ණයෙන්ද භූ ලක්ෂණ සිතියම්වල දක්නට ලැබේ.

සමෝච්ච රේඛා

- 100,200,300 වැනි මූලික සමෝච්ච රේඛා තද දුඹුරු වර්ණයෙන්ද, 20,40,60 වැනි අතරමැදි සමෝච්ච රේඛා ලා දුඹුරු වර්ණයෙන්ද හූ ලක්ෂණ සිතියම්වල දක්නට ලැබේ.

- සමෝච්ච රේඛා බහුලව විහිදෙන කඳුකර ප්‍රදේශවල 100,200,300ආදි වශයෙන් මූලික සමෝච්ච රේඛා පමණක් නම් කර ඇති අතර, එහි අන්තරය අනුව අතරමැදි සමෝච්ච රේඛා අගය තීරණය කළ හැකි වේ.

- පුළුල් තැනිතලා ප්‍රදේශවල සමෝච්ච රේඛා අන්තරය විශාල වන බැවින් එම ප්‍රදේශවල උස දැනගැනීම සඳහා, තැන් උස / ස්ථානීය උස දක්වා තිබේ.

- කඳුමුදුන්වල උස ත්‍රිකෝණමිතික ස්ථාන මගින් සඳහන් කර ඇත.

භූ විෂමතා ලක්ෂණ හඳුනා ගැනීම

- ❖ තැනිතලාව
- ❖ උස් බිම
- ❖ කඳුවැටිය / හෙල්වැටිය
- ❖ හුදකලා කන්ද හා කොත්කන්ද
- ❖ රැළි බිම
- ❖ නිම්නය සහ නෙරුව
- ❖ කඳු මුදුන
- ❖ බෑවුම
- ❖ කපොල්ල

තැනිතලාව

තැනිතලාවක් යනු භූමියේ පිහිටි සමතලා ප්‍රදේශයකි.



- ❖ සමෝච්ච රේඛා කිහිපයකට පමණක් සීමා වීම හෝ සමෝච්ච රේඛා දෙකක් අතර පරතරය විශාල වීම මගින් තැනිතලා බිමක් හඳුනාගත හැකිය.

- ❖ මෙවැනි ප්‍රදේශවල තැනින් තැන දක්වා ඇති උස ස්ථානීය උස/ තැන් උස ආධාරයෙන් ප්‍රදේශයේ තැනින් තැන වෙනස් වන උස දැන ගැනීමට පුළුවන.

රැළි බිම

තැනිතලා ප්‍රදේශයක දක්නට ලැබෙන මද උස්බිම් හා පහත් බිම්වලින් යුත් බිම් ප්‍රදේශය, රැළි බිම ලෙස හැඳින්වේ.

- ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල බොහෝ දුරට මෙවැනි රැළි බිම් ලක්ෂණ දක්නට ලැබේ.

- පුළුල් අන්තරයක් ඇති සමෝච්ච රේඛා දෙකක් අතර තැනින් තැන උස් බිම් දැක්වෙන සමෝච්ච රේඛා වලින් රැළි බිම් හඳුනාගත හැකි ය.



උස් බිම

යම් ප්‍රදේශයක ඇති උසින් වැඩි බිමක්, උස් බිම ලෙස හැඳින්වේ.

සමෝච්ච රේඛා බහුල ව මෙන්ම ආසන්නවද විහිදී ඇති අතර කඳුවැටි, සානු, නෙරු වැනි විවිධ භූ ලක්ෂණ දක්නට ලැබේ.



නිම්නය

- උස් බිම් දෙකක් අතර බොහෝ විට ගංගා ආශ්‍රිත ව පිහිටි දිගටි හැඩයකින් යුත් පහත් බිමකි.
- උස් බිම්වල මෙන් ම පහත් බිම් ආශ්‍රිත ව ද නිම්න හඳුනා ගත හැකි වේ.

- උස් බිම් ප්‍රදේශවල පටු, ගැඹුරු නිම්න ද තැනිතලාවල ඉතා පුළුල් නොගැඹුරු නිම්න ද දක්නට ලැබේ.
- සමෝච්ච රේඛා උස් බිම් දෙසට විහිදී තිබීමෙන් නිම්නයක් හඳුනා ගත හැකිය.



නෙරුව

උස් බිම් ප්‍රදේශයක සිට පහත් බිම් ප්‍රදේශයට නෙරා හෝ විහිදී ගිය සමෝච්ච රේඛා සහිත බිම් කොටස

"නෙරුව" නමින් හැඳින්වේ.

කඳුවැටිය

- මුදුන් කිහිපයකින් සමන්විත පටු දිගටි හැඩයෙන් විහිදෙන උසින් වැඩි ප්‍රදේශ, **කඳුවැටි** ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ මෙවැනි කඳුවැටි බහුලව ලැබේ.



හෙල්වැටිය

තැනිබිම් ආශ්‍රිත ව පිහිටි උසින් අඩු එක දිගට විහිදී ඇති උස් බිම් හෙල්වැටි නමින් හැඳින්වේ.





කඳු මුදුන

- කඳුවැටියක පිහිටි මුදුන්වල උස, ත්‍රිකෝණමිතික ලක්ෂණයකින් දක්වා තිබේ.

- කඳුවැටියක විවිධ උස මට්ටමින් යුත් කඳු මුදුන් දක්නට ලැබේ.



හුදකලා කන්ද හා කොත් කන්ද

❖ තැනිතලා බිම්වල තැනින් තැන හුදකලා ව පිහිටි උසින් අඩු කඳු ප්‍රදේශ, හුදකලා කඳු ලෙස හැඳින්වේ.

❖ මේවා සාමාන්‍යයෙන් 100m – 200m පමණ උසකින් යුක්ත වේ.

❖ හුදකලා කන්ද, කොතක ආකාරයෙන් පිහිටි විට එය කොත්කන්ද ලෙස හැඳින්වේ.

❖ එහි සමෝච්ච රේඛා වෘත්තාකාර ස්වරූපයක් ගනී.



බෑවුම

- ❖ උස් බිමක, විවිධාකාර බෑවුම් ලක්ෂණ දක්නට ලැබේ.
- ❖ සමෝච්ච රේඛා අතර පරතරය හා ස්වරූපය අනුව එම බෑවුම් හඳුනා ගත හැකිය.





මද බෑවුම

සමෝච්ච රේඛා දුරස්ථ ව විහිදී ඇත්නම් එය මද බෑවුමකි.





ශීඝ්‍ර බෑවුම / දළ බෑවුම

සමෝච්ච රේඛා ආසන්න ව විහිදී ඇත්නම් එයින්

ශීඝ්‍ර බෑවුමක් / දළ බෑවුමක් පෙන්නුම් කරයි.

මොහොර බෑවුම

- සමෝච්ච රේඛා ඉතාමත් ආසන්න ව පිහිටා තිබීමය.
- ඇතැම් අවස්ථාවල සමෝච්ච රේඛා එක මත එක වැටෙන තරමට ආසන්න වේ.
- මේ ආශ්‍රිත ව බොහෝ විට දියඇලි නිර්මාණය වේ.





උත්තල බෑවුම

බෑවුම් ප්‍රදේශයේ ඉහළ කොටසේ මද බෑවුමක් ද පහළ කොටසේ දළ බෑවුමක් ද පිහිටි විට එය **උත්තල බෑවුමකි.**



අවතල බෑවුම

බෑවුම් ප්‍රදේශයේ ඉහළ කොටසේ දළ බෑවුමක් ද පහළ කොටසේ මද බෑවුමක් ද දක්නට ලැබෙන විට එය

අවතල බෑවුමකි.







කපොල්ල

- ❖ කඳුවැටි දෙකක් අතර පිහිටි පහත් ප්‍රදේශය, කපොල්ලක් ලෙස හැඳින්වේ.
- ❖ කපොල්ලක් අතරින් ගංගාවක් ගලා බසී නම් එය ජල කපොල්ලකි.
- ❖ කඳුකර ප්‍රදේශවල මාර්ග ඉදිකිරීමේදී මෙවැනි කපොලු උපයෝගී කර ගෙන ඇත.



සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	1	9- I කොටස ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම් - ඇගයීම

සැකසුම: එම්. ටී.කේ.ඩී. ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

1. සමෝච්ච රේඛා යනු කුමක්ද?
2. මූලික සමෝච්ච රේඛාවල වර්ණය කුමක්ද?
3. අතරමැදි සමෝච්ච රේඛා අගය තීරණය වනුයේ කෙසේද?
4. භූ විෂමතා ලක්ෂණ කිහිපයක් නම් කරන්න.
5. බෑවුම් වර්ග කිහිපයක් නම් කර, එහි දළ සටහනක් ඇඳ දක්වන්න.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	1	9 - I කොටස ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම් - පිළිතුරු

සැකසුම: එම්. ටී.කේ.ඩී. ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

1.සමාන උස යා කර නිර්මාණය කරනු ලබන රේඛා සමෝච්ච රේඛා වේ.

2. මූලික සමෝච්ච රේඛා තද දුඹුරු වර්ණයෙන් යුක්තය.

3. මූලික සමෝච්ච රේඛාවල අන්තරය අනුව අතරමැදි සමෝච්ච රේඛා අගය තීරණය කළ හැකි වේ.

උදා:- මූලික සමෝච්ච රේඛා 100 ,200 ලෙස ඇති නම් අතරමැදි සමෝච්ච රේඛා වනුයේ 120,140,160,180 වේ.

4. තැනිතලාව

රැළි බිම	කඳු මුදුන
උස් බිම	හුදකලා කන්ද හා කොත්කන්ද
නිම්නය සහ නෙරුව	බෑවුම
කඳුවැටිය / හෙල්වැටිය	කපොල්ල

5. මද බෑවුම

ශීඝ්‍ර බෑවුම

මොහොර බෑවුම

උත්තල බෑවුම

අවතල බෑවුම



සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	2	09. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් - II කොටස

සැකසුම:-
එම්. ටී.කේ.ඩී. ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

භෞතික භූ දර්ශනයක හරස්කඩ නිර්මාණය

හරස්කඩ යනු :-

සිතියමක ස්ථාන දෙකක් සම්බන්ධ කරමින් අඳින ලද රේඛාවක් ඔස්සේ, කිසියම් ප්‍රදේශයක භෞතික භූ දර්ශනයෙහි පැතිකඩ ස්වරූපය දැන ගැනීමට අඳිනු ලබන පරිමාණානුකූල සැලැස්මය.

යම් යම් ප්‍රදේශයක භෞතික භූ දර්ශනය පැහැදිලිව හඳුනා ගැනීම සඳහා හරස්කඩ ප්‍රයෝජනවත් වේ.

සිතියමේ A – B රේඛාව මගින් දක්වා ඇති ප්‍රදේශයේ හරස්කඩ



හරස්කඩ නිර්මාණය

පලමු පියවර

- පළමුවෙන් ම අදාළ ස්ථාන දෙක (A-B රේඛාව) සම්බන්ධ කර රේඛාවක් අඳින්න.
- පාදක රේඛාව ඇඳ ගැනීමට එම A – B රේඛාවේ දිග ප්‍රමාණයට සමාන රේඛාවක් අඳින්න.
- මෙම රේඛාව දෙපස සිරස් රේඛා දෙකක් ඇඳ එහි එක් පසක සිරස් පරිමාණය ලකුණු කරන්න.
- සිතියමේ පරිමාණය තිරස් පරිමාණය වන අතර සිරස් පරිමාණය සඳහා සුදුසු පරිමාණයක් යොදා ගත හැකිය.
- මේ සඳහා අදාළ ප්‍රදේශයේ උස පිළිබඳව සැලකිලිමත් විය යුතුය.


Figure 2
X
Y
A
B
C
150'
100'
50'
0'
250
200
150
100
50
0

ඉහත සිතියම අනුව,

- ❖ එම ප්‍රදේශයේ උස 0 – 600m ට වැඩි උසක් බව පෙනේ.
- ❖ මෙම උස දැක්වීම සඳහා 1m =100mක් (2mm = 20m) ලෙස සිරස් පරිමාණය යොදා ගැනීම සුදුසුය.
- ❖ එම පරතරයට අනුව පාදක රේඛාවට සමාන්තර ව අදාළ උස ප්‍රමාණය දැක්වීය හැකි පරිදි රේඛා ඇඳ ගන්න.



දෙවන පියවර

7

- හරස් පැතිකඩ නිර්මාණය සඳහා කඩදාසියක් ගෙන එහි දාරය හරස් පැතිකඩ ඇඳීමට බලාපොරොත්තු වන සිතියමේ A – B රේඛාව මත තබන්න.
- A – B රේඛාව ඔස්සේ සමෝච්ච රේඛා කැපී ඇති ස්ථාන තිත් හෝ ඉරි මගින් කඩදාසියේ ලකුණු කර එම ස්ථානවල කැපී ඇති සමෝච්ච රේඛාවල වටිනාකම සටහන් කර ගන්න.



තුන්වන පියවර

- මෙම කඩදාසිය පරිමාණ සැලැස්මේ පාදක රේඛාව මත තබන්න.
- ඉන්පසුව නොවෙනස් වන පරිදි 100m රේඛාව මත කඩදාසිය තබා 100m උස සලකුණු කර ඇති ස්ථාන, පරිමාණ රේඛාවේ තිතකින් සලකුණු කර ගන්න.
- ඉන්පසුව 200m රේඛාව මත කඩදාසිය තබා එම උස ද ඉහත අයුරින් සලකුණු කර ගන්න.
- මෙසේ සියලුම උස ඊට අදාළ පරිමාණ රේඛාවන් මත සලකුණු කර ගන්න.



- ❖සෑම ස්ථානයක්ම සලකුණු කර ගත් පසුව පරිමාණ සටහනේ දැක්වෙන තිත් සම්බන්ධ වන සේ රේඛාවක් ඇඳ ගන්න.
- ❖රේඛාව ඇඳීමේදී උස් මුදුන් ඇති ස්ථානවල දී ඊට ඉහළින් ඇති රේඛාවට නොගෑවෙන සේ මුදුන ලකුණු කර ගන්න.
- ❖පහත් නිම්නවලදීද ඊට පහළ රේඛාවේ නොගෑවෙන සේ, තිත් සලකුණු කර ඇති ස්ථානවලින් පහළට යන ලෙස රේඛාව ඇඳ ගන්න.



- හරස්කඩ ඇඳීමේදී ආරම්භක ලක්ෂ්‍ය සහ අවසාන ලක්ෂයේ උස පිළිබඳ ව සැලකිලිමත් වී ඒ අනුව සිරස් අක්ෂ දෙකට රේඛාව සම්බන්ධ කරන්න.
- භූ ලක්ෂණ පෙන්නුම් කරන කොටස ලා දුඹුරු වර්ණයෙන් සේයා කර දැක්වීමෙන් අදාළ ප්‍රදේශයේ භෞතික භූ දර්ශනය වඩාත් පැහැදිලි වේ.



➢ හරස්කඩ නිර්මාණයේදී,

- මාතෘකාව දැක්වීම
- සිරස් අක්ෂයේ උඩ කෙළවරේ “m” (මීටර්) සලකුණ යෙදීම.
- සිරස් අක්ෂය ආරම්භයේ “0” දැක්වීම
- සිරස් පරිමාණය හා තිරස් පරිමාණය ලියා දැක්වීම අත්‍යවශ්‍ය වේ.

➢ උසින් වැඩි ප්‍රදේශයක් පෙන්නුම් කිරීම සඳහා හරස්කඩක් නිර්මාණය කරන විට, සිරස් පරිමාණය දක්වන රේඛාව 0න් පටන් ගෙන ආරම්භක උස දක්වන රේඛාව දක්වා පරිමාණය හකුළුවා ඉන් පසුව අදාළ උස ප්‍රමාණය සටහන් කළ යුතුය.

ජලවහන ලක්ෂණ

- කඳුකර ප්‍රදේශයකින් පටන් ගන්නා කුඩා දියපාරක් ලෙසින් **ගංගාවක්** ආරම්භ වේ.
- කුඩා දියපහරවල් රාශියක් එකතු වී **අතු ගංගාවක්** ද,
- අතු ගංගා රාශියක් එකතු වීමෙන් **ප්‍රධාන ගංගාව** ද නිර්මාණය වේ.
- ප්‍රධාන ගංගාව හා ඊට එකතු වන සියලු ම අතු ගංගා, අතු ගංගාවලට එකතු වන කුඩා දියපහරවල් සියල්ල එක්ව ගත් විට **ගංගා මණ්ඩලයක්** ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා මණ්ඩල 103ක් පමණ දක්නට ලැබේ.
- ගංගාවන්ගෙන් බොහොමයක් මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වී පහත් තැනිතලා හරහා භූ විෂමතාවට අනුකූල ව ගලා ගොස් දිවයිනේ විවිධ ස්ථානවලින් මුහුදට වැටේ.

ගංගා මණ්ඩලය


700
600
rahana
egasulla
ASSULA
05.79

Himalayas
Indus
HARAPPA
RAKHIGARHI
KALIBANGAN
MOHENJODARO
Thar Desert
DHOLAVIRA
Arabian Sea

තීර්යක් නිම්නය

කඳුකරයේ සිට ගලා එන ගංගා,

- කඳුවැටි දෙකක් අතරින් හෝ උස් බිම් දෙකක් අතර ඇති නිම්නය, තීර්යක් නිම්නයයි.
- ඒ ඔස්සේ හෝ ගලා බැසීමේ දී විවිධ ජලවහන රටා නිර්මාණය වේ.



ආයත නිම්නය

කඳුකරයේ සිට ගලා එන ගංගා,

- කඳුවැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදී ඇති නිම්නය ආයත නිම්නයයි.
- ඒ ඔස්සේ ගලා බැසීමේ දී විවිධ ජලවහන රටා නිර්මාණය වේ.



පෝෂක ප්‍රදේශය

- ❖ කිසියම් ගංගාවක් ජලය ලබන හෙවත් පෝෂණය වන ප්‍රදේශය, පෝෂක ප්‍රදේශයයි.
- ❖ පෝෂක ප්‍රදේශයේ දී ගංගාවට අතු ගංගා රාශියක් එකතු වීමෙන් එය පෝෂණය වේ.
- ❖ දිවයිනේ බොහෝ ගංගාවල පෝෂක ප්‍රදේශය මධ්‍යම කඳුකරයයි.



දියබෙත්ම

- ගංගා මණ්ඩල දෙකක් වෙන් සීමාව හෙවත් මායිම, දියබෙත්ම ලෙස හැඳින්වේ.
- එකම කඳුවැටියකින් ආරම්භ වී දෙපසට ගංගා ගලා බසින විට කඳුවැටියේ මුදුන දිය බෙත්ම බවට පත් වේ.





දියඇල්ල

- උස් ප්‍රදේශවල ගලා බස්නා ගංගාවල ජල ප්‍රමාණය අඩු වුවද පටු ගැඹුරු නිම්න ඔස්සේ මොහොර බෑවුම් සහිත ප්‍රදේශ හරහා ගලා යාම නිසා ඒ ස්ථානවල බොහෝ විට දියඇලි නිර්මාණය වේ.
- ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ මෙලෙස නිර්මාණය වූ දියඇලි රාශියක් දක්නට ලැබේ.

උදා:- දුන්හිඳ, බඹරකන්ද, දියලුම

ගං දඟරය

තැනිතලා ප්‍රදේශවල ඇති පුළුල් නිම්න දිගේ සෙමින් ගලන ගංගාවේ භාරය, තැනින් තැන තැන්පත් වී මාර්ගය ඇහිරී යාමෙන් ගංගාව, වක්‍රාකාර මාර්ගයක ගමන් කිරීම නිසා නිර්මාණය වන ලක්ෂණය, ගං දඟරය ලෙස හැඳින්වේ.



වගුරු බිම

- ගංගා ආශ්‍රිත පහත්බිම් ප්‍රදේශවල ජලය එක් රැස් වීමෙන් වගුරු බිම් නිර්මාණය වේ.
- ගංගාවල ජලමාර්ග ඇහිරී යාම ද වගුරු බිම් ඇති වීමට එක් හේතුවකි.
- පහත් ප්‍රදේශවල වර්ෂා ජලය එක් රැස් වීමෙන් ද වගුරු බිම් ඇති වේ.

හැඩපලු ගංගාව

- පහත් තැනිතලා ප්‍රදේශවල ඉතා සෙමින් ගලා බසිනා ගංගාව මගින් ගෙනෙන ද්‍රව්‍ය, ගඟ මැද තැන්පත් වී කුඩා දූපත් වැනි ලක්ෂණ නිර්මාණය වූ විට,

එය හැඩපලු ගංගාවක් ලෙස හැඳින්වේ.



අපශාඛා

- පහත්බිම් හරහා සෙමින් ගලා යන ගංගාව, අතු කීපයකට බෙදී මද දුරක් ගලා ගොස් නැවත ප්‍රධාන ගංගාවට එකතු වන විට ඒවා අපශාඛා ලෙස හැඳින්වේ.

- ඇතැම් ගංගා මුහුදට වැටෙන ගංමෝය අසල මෙවැනි අපශාඛා දක්නට ලැබේ.

- මහවැලි ගංගාවේ ජලය, ත්‍රිකුණාමලේදී අපශාඛා කිහිපයක් ඔස්සේ මුහුදට ගලා බැසීම සිදුවේ.



සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	2	09. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් - II කොටස -ඇගයීම-

සැකසුම :- එම්.ටී.කේ.ඩී.ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

01. සිතියමක හරස්කඩක් යනු කුමක්ද?

02. හරස්කඩ නිර්මාණයේදී අත්‍යවශ්‍ය වන කරුණු මොනවාද?

03. පහත සටහන් රූපසටහනේ A,B,C,D,E යන අක්ෂරවලට සමාන වන භූ ලක්ෂණය 1,2,3,4,5 යන ඉලක්කම්වලින් තෝරන්න.



නිවැරදි පිළිතුර තෝරන්න

04. ගංගා මණ්ඩල දෙකක් වෙන් කරන සීමාව හෙවත් මායිම (දියඇල්ල/දියබෙත්ම/වගුරුබිම) ලෙස හැඳින්වේ.

05. කිසියම් ගංගාවක් ජලය ලබන හෙවත් පෝෂණය වන ප්‍රදේශය (දියබෙත්ම/ගංගා මණ්ඩල/පෝෂක ප්‍රදේශය) යයි.

06. ගංගා ආශ්‍රිත පහත්බිම් ප්‍රදේශවල ජලය එක් රැස් වීමෙන් (වගුරු බිම්/තීර්යක් නිම්න/ගං දහර) නිර්මාණය වේ.

07. ප්‍රධාන ගංගාවට එකතු වන අතුගංගා හා කුඩා දියපහරවල් සියල්ල ගත්විට (අපශාඛාවක්/ගංගා මණ්ඩලයක්/දිය බෙත්මක්) ලෙස හැඳින්වේ.

08. පහත්බිම් හරහා ගලා යන ගංගාව, අතු කිහිපයකට බෙදී ගොස් නැවත ප්‍රධාන ගංගාවට එකතු වන විට ඒවා (අපශාඛා/ දියබෙත්ම/ගංගා මණ්ඩලය) ලෙස හැඳින්වේ.

09. ගංගාව වක්‍රාකාර මාර්ගයක ගමන් කිරීම නිසා නිර්මාණය වන ලක්ෂණය(වගුරු බිම/ හැඩපලු ගංගාව/ ගං දහරය) ලෙස හැඳින්වේ.

10. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා මණ්ඩල (103/105/101) පමණ දක්නට ලැබේ.

11. ගංගාව කඳුවැටි දෙකක් අතරින් හෝ උස් බිම් දෙකක් හරහා ඇති (ආයත නිම්නය/තීර්යක් නිම්නය/දියබෙත්ම) ඔස්සේ ගංගාව ගලාබැසීම සිදුවේ.

12. පටු ගැඹුරු නිම්න ඔස්සේ මොහොර බෑවුම් සහිත ප්‍රදේශ හරහා ගලා යාම නිසා ඒ ස්ථානවල බොහෝ විට (වගුරු බිම්/ ගං දහර/ දියඇලි) නිර්මාණ වේ.

13. ගංගාවක් මගින් ගෙනෙන ද්‍රව්‍ය ගඟ මැද තැන්පත් වී කුඩා දූපත් වැනි ලක්ෂණ නිර්මාණය වූ විට (හැඩපලු ගංගාවක්/ ගං දහරය/ අපශාඛා) ලෙස හැඳින්වේ.

14. කඳු වැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදී ඇති නිම්නය(ආයත නිම්නයක්/තීර්යක් නිම්නයක්/කපොල්ල)ලෙස හැඳින්වේ.

15. කඳුකර ප්‍රදේශයකින් පටන් ගන්නා කුඩා දියපාරක් ලෙසින් (වැවක්/ගංගාවක්/ජලාශයක්) ආරම්භ වේ.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	2	09. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් - II කොටස -පිළිතුරු-

සැකසුම :- එම්.ටී.කේ.ඩී.ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

01. යම් ප්‍රදේශයක භෞතික ස්වරූපය දැන ගැනීමට අඳිනු ලබන පරිමාණානුකූල සැලැස්ම හරස්කඩ ලෙස හඳුන්වයි.

02. මාතෘකාව දැක්වීම

සිරස් අක්ෂයේ උඩ කෙළවරේ ‘m’ (මීටර්) සලකුණ යෙදීම

සිරස් අක්ෂය ආරම්භයේ ‘0’ දැක්වීම

සිරස් පරිමාණය හා තිරස් පරිමාණය ලියා දැක්වීම

03.



04. දියබෙත්ම

05. පෝෂක ප්‍රදේශය

06. වගුරු බිම්

07. ගංගා මණ්ඩලයක්

08. අපශාඛා

09. ගං දහරය

10. 103

11. තීර්යක් නිම්නය

12. දියඇලි
13. හැඩපලු ගංගාව
14. ආයත නිම්නයක්
15. ගංගාවක්

සවියෙන් පෙරට අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	3	09. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් - III කොටස

සැකසුම:එම්.ටී.කේ.ඩී.ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

ජලවහන රටා

- ගංගා ගලා බසින ප්‍රදේශයේ ඇති භූ විෂමතාව සහ පාෂාණ සංයුතිය අනුව යම් ප්‍රදේශයක ජලවහන රටාව සකස් වේ.
- උස්බිම් ප්‍රදේශයකින් ආරම්භ වී විවිධ දිශාවලට ගංගා ගැලීම නිසා සෑදෙන ජලවහන රටාව, අරීය ජලවහන රටාව ලෙස හැඳින්වේ.
- මධ්‍යම කඳුකරය හා ඒ වටා පිහිටි පහත් ප්‍රදේශවලින් සමන්විත වූ ශ්‍රී ලංකාවේ, සමස්ත ජලවහන රටාව ම, අරීය ජලවහන රටාවක ලක්ෂණ පෙන්නුම් කෙරේ.






central uplift
Radial Drainage Pattern
Radial
Volcano
Radial

ශාඛීය ජලවහන රටාව

- ❖ ශාඛයක අතු විහිදී ඇති ආකාරයට අතු ගංගා, ප්‍රධාන ගංගාවට එකතු වේ නම්, එය ශාඛීය ජලවහන රටාව ලෙස හැඳින්වේ.
- ❖ අප රටේ බොහෝ ගංගාවල ශාඛීය ජලවහන රටාව දක්නට ලැබේ.





ජාලාකාර ජලවහන රටාව

- අතු ගංගා, කොටුදැලක ආකාරයෙන් ඍජුකෝණීය රටාවකට ප්‍රධාන ගංගාව හා සම්බන්ධ වන විට එවැනි රටාවක් ජාලාකාර ජලවහන රටාවක් ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකාවේ නිරිතදිග තැනිතලා ප්‍රදේශයේ මෙම ජලවහන රටාව හඳුනා ගත හැකිය.
- ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයේ ඇති සමාන්තර හෙල්වැටි සහ ඒ ආශ්‍රිත ආයත නිම්න සහ තීර්යක් නිම්න මෙවැනි ජලවහන රටාවක් නිර්මාණය වීමට හේතු වී තිබේ.

- ❖කැළණි ගඟ, කළු ගඟ වැනි ප්‍රධාන ගංගා, මධ්‍යම කඳුකරයේ සිට නිරිතදිග සමාන්තර හෙල්වැටි හරහා පිහිටි තීර්යක් නිම්න ඔස්සේ ද,
- ❖ප්‍රධාන ගංගාවට එකතු වන අතු ගංගා සමාන්තර හෙල්වැටි අතර පිහිටි ආයත නිම්න ඔස්සේ ද ගලා බසී.
- ❖ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශය දැක්වෙන 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල මෙවැනි ජාලාකාර ජලවහන රටා දැක ගත හැකිය.





Figure 3.10 A trellised drainage pattern

තීර්යක් නිම්නය

ආයත නිම්නය

වෙරළ ලක්ෂණ

- 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල වෙරළ තීරයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ ද භෞතික ලක්ෂණවලට අයත් වේ.

- කලපුව, බොක්ක, තුඩුව, වැලිපරය, ගංමෝය, දූපත් වෙරළ තීරයේ කැපී පෙනෙන භූ ලක්ෂණ වේ.

- වෙරළ තීරයේ වෙරළ ඉම ඛාදනය හා නිධිසාදනය වීමෙන් මෙම ලක්ෂණ නිර්මාණය වී තිබේ.

- රට අභ්‍යන්තරයේ සිට ගලා බසිනා ගංගා, වෙරළ ඉමේ පාෂාණවල ස්වභාවය, මුහුදු තරංගවල බලපෑම යනාදිය වෙරළ ලක්ෂණ නිර්මාණය වීම කෙරෙහි බලපා ඇත.

10

දූපත්

- ❖සෑම දිශාවකින්ම ජලයෙන් වට වූ ගොඩබිම් ප්‍රදේශයක් දූපතක් ලෙස හැඳින්වේ.
- ❖ශ්‍රී ලංකාවේ උතුරු, බටහිර හා නිරිතදිග ප්‍රදේශවල වෙරළ ආසන්නයේ කුඩා දූපත් බොහෝ ගණනක් දක්නට ලැබේ.
- ❖ඩෙල්ෆ්ට්, කයිට්ස්, නාගදීපය (නයිනතිව්) යනාදිය උතුරු වෙරළ ප්‍රදේශයේ පිහිටි දූපත් කිහිපයකි.

කලපුව

- සාගරය ගොඩබිම තුළට කාවැදීම නිසා, පටු වැලිබිම් තීරුවකින් මුහුදින් වෙන් ව එහෙත් පටු විවරයකින් මුහුදට සම්බන්ධ වී ඇති භූ ලක්ෂණය, කලපුවක් ලෙස හැඳින්වේ.

උදා:- මීගමුව, මඩකලපුව, පුත්තලම

තුඩුව

- වෙරළ තීරයේ සාගරය දෙසට නෙරා ඇති පටු ගොඩබිම් කොටස, තුඩුව නමින් හැඳින්වේ.

  උදා:- දෙවුන්දර තුඩුව, පේදුරු තුඩුව, සංගමන්කන්ද තුඩුව

බොක්ක

- කලපුවකට වඩා වැඩි පුළුල් විවරයකින් සාගරය හා සම්බන්ධ වූ ගොඩබිම තුළට කාවැදුණු මුහුදු කොටස, බොක්ක නමින් හැඳින්වේ.

  උදා:- ආරුගම් බොක්ක, කොඩ්ඩියාර් බොක්ක, වැලිගම් බොක්ක

- මුහුදු බොකු, කුඩා ධීවර යාත්‍රා නවතා තැබිය හැකි ධීවර වරායන් ලෙස ද යොදා ගැනේ.

ගංමෝය

- ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය, ගංමෝය වශයෙන් හැඳින්වේ.
- මෝය ආසන්න වෙරළ තීරයේ වැලිපර ද,
- ගොඩබිමට ආසන්න ප්‍රදේශවල වගුරුබිම් ද දක්නට ලැබේ.

වැලිපරය

- මුහුදු රළ, ගංගා යනාදිය මගින් ගෙනෙන වැලි, වෙරළ තීරය දිගේ තැන්පත් වීමෙන් නිර්මාණය වන වැටි,

වැලිපර ලෙස හැඳින්වේ.


MATARA
Matara
වැලිපරය
දූපත
ගංමෝය
බොක්ක
තුඩුව
DONDRA
Dondra Head

ස්වභාවික වෘක්ෂලතා

භූමිය මත ස්වභාවිකව වැවී ඇති ලඳු කැළෑ, වනාන්තර, තණ බිම්, කඩොලාන යනාදිය ස්වභාවික වෘක්ෂලතාවලට අයත් වේ.

භූමියේ විෂමතාව, පාෂාණ හා දේශගුණය, වෘක්ෂලතා ව්‍යාප්තිය කෙරෙහි බලපා තිබේ.

මෙම ස්වභාවික වෘක්ෂලතා, භූ ලක්ෂණ සිතියම්වල සංකේත මගින් දක්වා ඇත.



ලඳුකැළෑ කඩොලාන

වනාන්තර තණ බිම්

ප්‍රදේශයක සමස්ත භූ දර්ශනය,

භූ ලක්ෂණ සිතියමකින් නිරූපණය කෙරේ.

භෞතික ලක්ෂණ එකිනෙක හඳුනා ගැනීම තුළින් භෞතික භූ දර්ශනයද,

සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කිරීම මගින් මානුෂ භූ දර්ශනය ද හඳුනා ගත හැකිය.

භූ ලක්ෂණ සිතියමක සංස්කෘතික ලක්ෂණ හඳුනා ගැනීම

- ❖මිනිසා විසින් භූමිය පරිහරණය කර ඇති ආකාරය සහ එහි නිර්මාණය වී ඇති ලක්ෂණ, සංස්කෘතික ලක්ෂණ ලෙස හඳුන්වයි.
- ❖1:50,000 භූ ලක්ෂණ සිතියම්වල සූචකයෙහි මායිම්, සංචාරක තොරතුරු, මංමාවත්, දුම්රිය මාර්ග වැනි ශීර්ෂ යටතේ සංස්කෘතික ලක්ෂණ ප්‍රධාන වශයෙන් දක්වා ඇත.
- ❖ජලවහනය, ස්වභාවික වෘක්ෂලතා හා වෙනත් ලක්ෂණ යන ශීර්ෂ යටතේ ද ඇතැම් සංස්කෘතික ලක්ෂණ නිරූපණය කරන සංකේත ඇතුළත් කර ඇත.
- ❖භෞතික භූ දර්ශනය මත නිර්මාණය වී ඇති මිනිස් කටයුතුවල ව්‍යාප්තිය විවිධ සංකේත හා වර්ණ භාවිතයෙන් සිතියම මත නිර්මාණය කර ඇති ආකාරය, සිතියම කියවීමෙන් හඳුනා ගත හැකි වේ.

සම්මත සලකුණු



මායිම්
පළාත
දිස්ත්‍රික්කය
උප දිසාපති කොට්ඨාසය
ග්‍රා. සේ. නි. කොට්ඨාසය
නගර සභා සීමා
රක්ෂිත වන / අභයභූමි
සංචාරක තොරතුරු
නානායම් / හෝටලය
ඓතිහාසික ස්ථාන
මංමාවත්
A1
B9
ප්‍රධාන මාර්ගය (ඒ)
ප්‍රධාන මාර්ගය (බී)
ඉදිකරන ප්‍රධාන මාර්ග
සෙසු මාර්ග
ජීප් රිය කරත්ත පාර (කුරු පාර)
අඩිපාර
බිම් ගෙය
මගින් ගෙන යන තොටුපළ
දියමංකඩ
පාලම / බෝක්කුව
අඩිපාලම
වෘක්ෂලතාවන්
වී
තේ
රබර්
පොල්
වෙනත් වැවිලි / ගෙවත්ත
වගුරුබිම් / කඩොලාන
ලඳුකැළෑ / වනාන්තර
තණබිම් / හේන
වෙනත් ලක්ෂණ
ඉදිකළ ප්‍රදේශ
ගොඩනැගිල්ල
විශේෂ ගොඩනැගිල්ල
තැපැල් / උපතැපැල් කාර්යාලය
පොලිසිය / උසාවිය
බෞද්ධ / හින්දු සිද්ධස්ථානය
ක්‍රිස්තියානි / මුස්ලිම් පල්ලිය
ප්‍රදීපාගාරය හෝ පහන් කණුව
සංචාරක බංගලාව
පාසල / රෝහල
දුම්රිය මාර්ග
පුළුල් ඒකීය මාර්ගය
පුළුල් ද්විතීය මාර්ගය
පටු මාර්ගය
බිම් ගෙය
පාලම
දුම්රිය මග හරහා ආරක්ෂිත පාර
දුම්රිය මග හරහා අනාරක්ෂිත පාර
කණ්ඩිය (ඉවුර)
කැපුම
දුම්රියපොළ/දුම්රිය නැවතුම
පාලම උඩින් පාර/පාලම යටින් පාර
ජලවහනය
වැව / පාළු අත්හරින ලද වැව
වාරිමාර්ගය (වාරි ඇළ)
දියවල / වේල්ල
භූ විෂමතාව
200
පිටිගල
848
270
මූලික සමෝච්ච රේඛාව
අතර මැදි සමෝච්ච රේඛාව
අතිරේක සමෝච්ච රේඛාව
සම ගැඹුරු රේඛාව
ත්‍රිකෝණමිතික උස / ස්ථානීය උස
ගල්වල / ගල
වැලි තලාව හෝ වෙරළ

මායිම් වර්ග

- 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල සියලු ම පරිපාලන මායිම් රතු වර්ණයෙන් සහ විවිධ සංකේත මගින් දක්වා ඇත.
- මෙම මායිම් අතර, රක්ෂිත අභය භූමි මායිම් ද ඇතුළත් වන නමුදු අභය භූමිය තුළ ඇත්තේ භෞතික පරිසරයට අයත් ලක්ෂණයන් ය.
- මෙම මායිම්, සිතියමේ දක්නට ලැබුණ ද භූමිය තුළ විද්‍යාමාන නොවන සංස්කෘතික ලක්ෂණ බව ද අවබෝධ කර ගත යුතුය.
- පරිපාලන මායිම් වෙන් කරන සීමා ලෙස, බොහෝ දුරට ගංගා, කඳුවැටි වැනි භෞතික ලක්ෂණ පදනම් කර ගෙන ඇති බව සිතියම් නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වේ.

Hebaragoda
වනාන්තර
ලඳු කැළෑ
Bandaraketiyagama
Kahagolla Arawa
Pathahagala

Muttettuthenna
Bembiya
RANTAMBE RESERVOIR
ASNADUWA
Bandaraketiyagama
RANTAMBE SANCTUARY

සංචාරක තොරතුරු

- සංචාරකයින්ට අවශ්‍ය තොරතුරු ලෙස තානායම, හෝටලය, ඓතිහාසික ස්ථාන යනාදිය ද භූ ලක්ෂණ සිතියම්වල සංකේත මගින් ඉදිරිපත් කර ඇත.
- සිතියම් කියවීමේ දී මේ එක් එක් ලක්ෂණ ඉදිරිපත් කිරීමට යොදා ඇති සංකේත හා වර්ණ පිළිබඳ ව දැනුවත් වීම ඉතා වැදගත් වේ.

සංචාරක තොරතුරු

තානායම



හෝටලය



ඓතිහාසික ස්ථාන

මාර්ග

- භූ ලක්ෂණ සිතියම්වල මංමාවත් යන ශීර්ෂය යටතේ ද, දුම්රිය මාර්ග යන ශීර්ෂය යටතේ ද මාර්ග පෙන්නුම් කරන සංකේත ඇතුළත් කර ඇත.
- අධිවේගී මාර්ග - මෑත කාලයේ ගොඩනගන ලද අධිවේගී මාර්ග මීට පෙර භාවිතා කළ සිතියම්වල දක්වා නොමැති වුවද මේ වන විට අධිවේගී මාර්ග ඇතුළත් කර සිතියම් නිර්මාණය කර ඇත. එම සිතියම් භාවිතයට ගනිමින්ද පවතී.

ජල සම්පාදනය

- ප්‍රදේශයක ජල සම්පාදනය යටතට ගැනෙන වැව් හා වාරිමාර්ග පිළිබඳ සංකේත සංස්කෘතික ලක්ෂණවලට අයත් වේ.
- ජලපවාහනය යන ශිර්ෂය යටතේ මෙම ලක්ෂණ, සංකේත මගින් දක්වා තිබේ.



වගා බිම්

- සංස්කෘතික ලක්ෂණවලට අයත් වන වගා බිම්, භූ ලක්ෂණ සිතියම්වල වෘක්ෂලතා ශීර්ෂය යටතේ දක්වා ඇත.
- වගාවන් අතරින් ප්‍රධාන භෝග වන වී, තේ, පොල්, රබර් සහ වෙනත් වගාවන් ද ගෙවතු වගා බිම් ද හඳුනා ගැනීම ගැනීම සඳහා භාවිතා වන සංකේත ඇතුළත් කර තිබේ.
- වගා බිම් දැක්වීමේ දී,

වී වගා බිම් කොළ පැහැයෙන් ද,
ගෙවතු කහ පැහැයෙන් ද,
සෙසු වගාවන් කහ පැහැති පසුබිමක කොළ පාට සංකේත
මගින් ද,

දක්වා ඇත.

- සිතියම්ගත ප්‍රදේශයේ භූ දර්ශනය විවරණය කිරීමේ දී සියලු ම වගාවන් සංකේත මගින් නිවැරදි ව හඳුනා ගෙන තිබීම ඉතාමත් වැදගත් වේ.

වගා බිම්



වී

තේ

රබර්

පොල්

වෙනත් වැවිලි / ගෙවත්ත

විශේෂිත ගොඩනැගිලි

- වෙනත් ලක්ෂණ ශීර්ෂය යටතේ විශේෂිත ගොඩනැගිලි ඇතුළත් කර ඇත.

  **ස්ථිර ගොඩනැගිලි කුඩා කොටුවකින් ද,

  **විශේෂ ගොඩනැගිලි ඊට වඩා විශාල කොටුවකින් ද දැක්වේ.

  **විශේෂ ගොඩනැගිල්ල ආශ්‍රිත ව ඊට අදාළ නම් ලියා ඇත.

- විශේෂත්වයක් ගන්නා පොදු ගොඩනැගිලි සංකේත මගින් දක්වා ඇති අතර මේවා ප්‍රදේශයට සේවා සපයන පොදු සේවා මධ්‍යස්ථාන සහ ආගමික සිද්ධස්ථාන ලෙස හඳුනා ගත හැකිය.
- නාගරික ප්‍රදේශවල රෝස පැහැයෙන් (ලා රතු) පෙන්නුම් කර ඇති ඉදිකරන ලද බිම්, සංස්කෘතික ලක්ෂණ අතර කැපී පෙනේ.
- සංස්කෘතික ලක්ෂණ දැක්වීමට භාවිත කර ඇති විවිධ සංකේත පරිමාණානුකූල ඒවා නොවේ.
- භූ ලක්ෂණ සිතියම්වල යෙදෙන සංකේත, විවිධ සංස්කෘතික ලක්ෂණ හඳුනා ගැනීම සඳහා පමණක් යෙදෙන සම්මත සලකුණු සේ සැලකිය යුතුය.

වෙනත් ලක්ෂණ
ඉදිකළ ප්‍රදේශ
ගොඩනැගිල්ල
විශේෂ ගොඩනැගිල්ල
තැපැල් / උපතැපැල් කාර්යාලය
පොලිසිය / උසාවිය
බෞද්ධ / හින්දු සිද්ධස්ථානය
ක්‍රිස්තියානි / මුස්ලිම් පල්ලිය
ප්‍රදීපාගාරය හෝ පහන් කණුව
සංචාරක බංගලාව
පාසල / රෝහල


Kalugange
Agrarian Services
Centre
Hattota Amuna
Wellewela
Tingolagala

Amanakattuwa
Talgiwa
Hungawila
Kala Wewa
Kusalanagama
Wana Akkara
Maha Akkara
Palugaswewa

Batalakanattegoda
Denipitiya (Moor)
Denipitiya (Sinhala)
Waraka
Meeruppa
WELIGAMA
Polwatta
Ponhettimulla
Galbokka
Denipitiya Central
Denipitiya West
Denipitiya East
Warakapitiya
Nidahangala
Group
KORALAGEKANDA
Pelena
North
A 2
Divisional Secretariat
Parei Duwa
Pelena
South
Nidangala
Polwatumodara
Henwala West
WELIGAMA BAY
WELIGAMA

සිතියම් විවරණය

- 1:50,000 භූ ලක්ෂණ සිතියම මගින් ස්වභාවයෙන් නිර්මාණය වී ඇති භෞතික භූ දර්ශනයත් ඒ මත දිගු කාලයක් තුළ මිනිසා විසින් ගොඩනගන ලද සංස්කෘතික භූ දර්ශනයක් නිරූපණය කොට ඇත.
- සිතියම්ගත ප්‍රදේශයේ භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර කැපී පෙනෙන සම්බන්ධතාවක් පවතින අතර සිතියම් විවරණයේ දී එම සබඳතා පිළිබඳ ව විස්තර කිරීම අවශ්‍ය වේ.
- ප්‍රදේශයක පවතින භූ විෂමතාවට අනුකූල ව

  උදා:- එම ප්‍රදේශයේ මාර්ග රටාව

  කෘෂිකාර්මික භූමි පරිභෝගය

  වාරිමාර්ග පද්ධති

  ජනාවාස රටාව යනාදිය නිර්මාණය වී ඇති බව

භූ ලක්ෂණ සිතියම් නිරීක්ෂණය කිරීමේ දී,

- තැනිතලා ප්‍රදේශයක ඍජු ව විහිදෙන මාර්ග රටාවක් ද
- කඳුකර ප්‍රදේශයක කපොලු හරහා වංගු සහිත ව විහිදෙන මාර්ග රටාවක් ද

  හඳුනා ගත හැකි ය.

- කඳුකර ප්‍රදේශවල මහාමාර්ග බොහෝ දුරට ගංගා නිම්න ආශ්‍රිත ව විහිදී තිබ



සිතියම්ගත ප්‍රදේශයේ කෘෂිකාර්මික භූමි පරිභෝගය පිළිබඳ ව සලකා බැලීමේ දී භූමියේ ස්වරූපය අනුව භෝග වර්ග තෝරා ගෙන වගා කර ඇති බව ද පැහැදිලි වේ.

උදා:-

- තැනිතලා ප්‍රදේශවල ගංගා නිම්න ආශ්‍රිත ව පුළුල් ව විහිදුණු වී වගා බිම් ද
- කඳුකර ප්‍රදේශවල ගංගා නිම්න ආශ්‍රිත ව පටු දිගටි වී වගා බිම් ද
- කඳුකර ප්‍රදේශවල තේ වගාව ද
- මධ්‍යම උසකින් යුත් කඳු බෑවුම් ප්‍රදේශවල රබර් වගාව ද
- වෙරළබඩ සහ අවට ප්‍රදේශවල පොල් වගාව ද
- වියළි කලාපීය දිස්ත්‍රික්කවල ලඳු කැළෑ ආසන්නයෙහි හේන් වගාව ද

ව්‍යාප්ත ව ඇති බව දක්නට ලැබේ.


Asweddumа
Kagama 5 Ela
Walpalugama
Kallanthiyagama
Kala Karampewa
Kagama 2 Ela
Helabodugama
Akkara Pansiyaya
Yaddigama
Galnewa Town
Pugallagama
Hiripitiyawa
Kattaragama
Mahagalnewa
Amunawetiya
Amanankattuwa
Galnewagama
Handungama
Kudagalnewa
Pitiyayaya
Malbaligala
Yalegama
Kusalanagama
Hunguwila


30
DULTON
(Upper)
AMHERST
1500
1600
ALPOLAKANDA
WALDEMAR
661.58

Udukawa
Akurugoda North
Nidanwela
Akurugoda West
Akurugoda
Akurugoda South
Charley Mount
Danapathy
Diviyagalahena
Netewwe
Uruwitike
Sundaranayaga
Warakapitiya North
Jayawickramapura


Polwatta
Denipitiya West
Denipitiya East
Warakapitiya
Nidahangala Group
Pelena North
KORALAGEKANDA
A2
1
Pelena South
Nidangala
Polwatumodara
Henwala West
5
4
Sindukara
Tannegoda
WELIGAMA
3
Kehelkanda
Nugaganhena
Mirissa North
Mirissa Udupila
Mirissa South
Pemuyana
Mirissa South
8
Bandaramulla
HARBOUR

Halambewewa
S I O N
Handungama
Walagewewa

යම් ප්‍රදේශයක ජලසම්පාදන කටයුතු පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී

- ගංගා නිම්න ආශ්‍රිත ව විශාල වාරිමාර්ග පද්ධති ඉදිකර තිබීම
- පටු කපොලු මැදින් ගලා බසිනා ගංගාවල දෙපස පිහිටි කඳුවැටිවල නෙරු සම්බන්ධ කොට, බැමි බැඳ වැව් ඉදිකිරීම
- වැව් බැම්මට පහළ ප්‍රදේශයේ වගා කිරීම

වැනි ලක්ෂණ හූ විෂමතාවයට අනුකූල ව නිර්මාණය වූ සංස්කෘතික ලක්ෂණ ලෙස හඳුනා ගත හැකිය.



- ප්‍රදේශයක ජනාවාස රටාව සකස් වීමේ දී ද භූ විෂමතාව බලපාන බව සිතියම් නිරීක්ෂණයේ දී පැහැදිලි වේ.
  - තැනිතලා ප්‍රදේශවල ජනාවාස පුළුල් ප්‍රදේශයක පැතිරී ඇත
  - කඳුකර ප්‍රදේශවල නිම්න ආශ්‍රිත ව තැනින් තැන පිහිටි කුඩා ජනාවාස දක්නට ලැබේ.





- සිතියම් විවරණයේ දී ජනාවාස රටාව හා ජනාවාස වර්ග පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වේ.
- ජනාවාස ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව
  - රේඛීය ජනාවාස
  - පොකුරු ජනාවාස
  - විසිරුණු ජනාවාස රටාවන් හඳුනා ගත හැකිය.



මාර්ග සහ පටු බිම් තීරු දිගේ,

- රේඛීය ජනාවාස රටාවක් ද

මාර්ග මංසන්ධි ආශ්‍රිත ව ,

- පොකුරු ජනාවාස රටාවක් ද දැකිය හැකිය.

මිනිසුන්ගේ ජීවන රටාව අනුව ද ,

- වැව් ජනාවාස
- ධීවර ජනාවාස
- වතු ජනාවාස ද හඳුනා ගත හැකිය.

වැව් ආශ්‍රිත ව වැව් ගම්මාන ද,

වෙරළ දිගේ ධීවර ගම්මාන ද,

වතු ආශ්‍රිතව වතු ජනාවාස ද දක්නට ලැබේ.



රේඛීය ජනාවාස

පොකුරු ජනාවාස

ජනාවාස ග්‍රාමීය නාගරික වශයෙන් ද වෙන් වී තිබේ.

නගරයක

- රෝහල්
- ප්‍රධාන තැපැල් කාර්යාල
- ප්‍රධාන බැංකු
- උසාවි
- පොලිස් ස්ථාන
- ප්‍රධාන මාර්ග ගණනාවක් ඒකරාශී වී තිබීමද
- සමහර ස්ථානවල දුම්රිය ස්ථාන ද
- ඉදිකළ ප්‍රදේශ රෝස පාට වර්ණයෙන් දක්නට ලැබේ.

ග්‍රාමීය ජනාවාස

- උප තැපැල් කාර්යාල
- අප්‍රධාන මාර්ග
- කරත්ත පාර
- අඩි පාර හඳුනා ගත හැකිය.

- පරිපාලන මායිම් තීරණය කිරීමේ දී බොහෝ විට භෞතික ලක්ෂණ යොදා ගෙන ඇත.

  **කඳුවැටිවල මුදුන්

  ** ගංගා දිගේ

- පරිපාලන මායිම් රේඛා වැටී ඇති බව හූ ලක්ෂණ සිතියම් නිරීක්ෂණයේ දී පැහැදිලි වේ.

- සිතියම් විවරණයේ දී ජන සමාජය තුළ ඇති සමාජයීය අනන්‍යතාව පිළිබඳ ව ද අවබෝධයක් ලබා ගත හැකි වේ.

  **එක ම ප්‍රදේශයක් තුළ විවිධ ආගමික සිද්ධස්ථාන තිබීමෙන්

  **ආගමික විවිධත්වය මෙන් ම ජන වර්ග ද

හඳුනා ගැනීමට පුළුවන.



සවියෙන් පෙරට අපි එකට
***e* - ඉගෙනුම් පාසල**
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	**3**	**09. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් - III කොටස -ඇගයීම-**

සැකසුම :- එම්.ටී.කේ.ඩී.ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

නිවැරදි පිළිතුරු හිස්තැන සඳහා යොදන්න.

01. උස්බිම් ප්‍රදේශයකින් ආරම්භ වී විවිධ දිශාවලට ගංගා ගැලීම නිසා සෑදෙන ජලවහන රටාව .... ලෙස හැඳින්වේ.
02. ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය .... වශයෙන් හැඳින්වේ.
03. ශාකයක අතු විහිදී ඇති ආකාරයට අතු ගංගා ප්‍රධාන ගංගාවට එකතු වේ නම් එය .... ජලවහන රටාව ලෙස හැඳින්වේ.
04. වෙරළ තීරයේ සාගරය දෙසට නෙරා ඇති පටු ගොඩබිම් කොටස .... නමින් හැඳින්වේ.
05. කැළණිගඟ, කළුගඟ, වැනි ප්‍රධාන ගංගා, මධ්‍යම කඳුකරයේ සිට නිරිතදිග සමාන්තර හෙල්වැටි හරහා පිහිටි .... නිම්න ඔස්සේ ප්‍රධාන ගංගාවට එකතු වේ.
06. කලපුවකට වඩා වැඩි පුළුල් විවරයකින් සාගරය හා සම්බන්ධ වූ ගොඩබිම තුළට කාවැදුණු මුහුදු කොටස .... නමින් හැඳින්වේ.
07. ප්‍රධාන ගංගාවට එකතු වන අතු ගංගා සමාන්තර හෙල්වැටි අතර පිහිටි .... නිම්න ඔස්සේ ද ගලා බසී.
08. සෑම දිශාවකින් ම ජලයෙන් වට වූ ගොඩබිම් ප්‍රදේශයක් .... ලෙස හැඳින්වේ.
09. අතු ගංගා කොටුදැලක ආකාරයෙන් සෘජුකෝණීය රටාවකට ප්‍රධාන ගංගාව හා සම්බන්ධ වන විට එවැනි රටාවක් .... ජලවහන රටාවක් ලෙස හැඳින්වේ.
10. ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශය දැක්වෙන 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල .... ජලවහන රටා දැක ගත හැකිය.

11. මුහුදු රළ, ගංගා යනාදිය මගින් ගෙනෙන වැලි, වෙරළ තීරය දිගේ තැන්පත් වීමෙන් නිර්මාණය වන වැටි .... ලෙස හැඳින්වේ.

12. සාගරය ගොඩබිම තුළට කාවැදීම නිසා පටු වැලිබිම් තීරුවකින් මුහුදින් වෙන් ව එහෙත් පටු විවරයකින් මුහුදට සම්බන්ධ වී ඇති භූ ලක්ෂණය .... ලෙස හැඳින්වේ.

13. භූමිය මත ස්වභාවිකව වැවී ඇති ලඳු කැළෑ, වනාන්තර, තණ බිම්, කඩොලාන යනාදිය .... වෘක්ෂලතාවලට අයත් වේ.

14. සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කිරීම තුළින් .... භූ දර්ශනය හඳුනා ගත හැකිය.

15. පහත සඳහන් සිතියම උපයෝගී කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I. සිතියම් ප්‍රදේශයේ බහුලව වගා කර ඇති බෝග වර්ගය නම් කරන්න.

II. ප්‍රදේශය පුරා විහිදී ඇති ප්‍රධාන වශයෙන් දක්නට ඇති මාර්ග පද්ධති 3ක් නම් කරන්න.

III. ප්‍රදේශයේ දක්නට ඇති පොදු ගොඩනැගිලි තුනක් නම් කරන්න.

IV. ප්‍රධාන වගාවට අමතර ඇති වෙනත් වගා තුනක් ලියන්න.

V. ප්‍රදේශයේ දක්නට ලැබෙන දුම්රිය ස්ථාන ගණන කොපමණද?

VI. සිතියමේ ප්‍රදේශයට දක්නට ඇති ජනාවාස රටාව නම් කරන්න.

VII. මෙම සිතියම් ප්‍රදේශය කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සපයාගනු ලබන්නේ කෙසේද?

VIII. ප්‍රදේශය හරහා වැටී ඇති මායිම නම් කරන්න.

IX. ස්වභාවික ලක්ෂණ තුනක් නම් කරන්න.

X. සමස්ත ප්‍රදේශයම ගත්විට (කඳුකර/ තැනිතලා/ වෙරළබඩ) ප්‍රදේශයකි.

සවියෙන් පෙරට අපි එකට
***e* - ඉගෙනුම් පාසල**
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
11	භූගෝල විද්‍යාව	**3**	**09. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් - III කොටස -පිළිතුරු-**

සැකසුම :- එම්.ටී.කේ.ඩී.ප්‍රියන්ති
බප/හො/අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

01. අරීය
02. ගංමෝය
03. ශාඛීය
04. තුඩුව
05. තීර්යක්
06. බොක්ක
07. ආයත
08. ද්වීපතක්
09. ජාලාකාර
10. ජාලාකාර
11. වැලිපරය
12. කලපුව
13. ස්වභාවික
14. මානුෂ

15. i. වී වගාව

ii. මහාමාර්ග, දුම්රිය මාර්ග, අප්‍රධාන මාර්ග

iii. පාසල, තැපැල් කාර්යාලය, රෝහල, පන්සල, උප තැපැල් කාර්යාලය, දුම්රිය ස්ථානය

iv. ගෙවතු වගාව, පොල් වගාව, හේන් වගාව

v. 3

vi. රේඛීය ජනාවාස රටාවක්.

vii. අතු ගංගා හා වැව් මගිනි.

Viii. උප දිසාපති කොට්ඨාශ මායිමක්

ix. වනාන්තර, ලඳු කැළෑ, අතු ගංගා

x. තැනිතලා